(අටවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

**අංක 34.]**

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2018 සැප්තැම්බර් 07 වැනි සිකුරාදා පූ. භා. 10.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

**ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

**ගරු තලතා අතුකෝරල මහත්මිය,** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය

**ගරු වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

**ගරු ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

**ගරු දයා ගමගේ මහතා,** සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** බුද්ධශාසන අමාත්‍යතුමා

**ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

**ගරු තිලක් මාරපන මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

**ගරු අර්ජුන රණතුංග මහතා,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

**ගරු රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

**ගරු ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

**ගරු ජේ. සී. අලවතුවල මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු රංජිත් අලුවිහාරේ මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු පියසේන ගමගේ මහතා,** තරුණ කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ සහ දක්ෂිණ සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ලකී ජයවර්ධන මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු වසන්ත සේනානායක මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික සමගිය හා සහජීවනය රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු ලසන්ත අලගියවන්න මහතා,** මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු එඩ්වඩ් ගුණසේකර මහතා,** අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු බුද්ධික පතිරණ මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,** පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු මුත්තු සිවලිංගම් මහතා,** සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා

---

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

**ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා**

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**

**ගරු වේලු කුමාර් මහතා**

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**

**ගරු චන්දිම ගමගේ මහතා**

**ගරු සිරිපාල ගමලත් මහතා**

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මුහම්මදු නසීර් මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරානාත් බස්නායක මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු වමල් රාජපක්ෂ මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

**ගරු තිලංග සුමතිපාල මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**

**ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා**

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන** : නියෝජ්‍ය කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

''ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික සහජීවනය සහතික කිරීම පිණිස ඒ පිළිබඳව අධ්‍යයනය කර සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ සේවය පිණිස මතු සඳහන් මන්ත්‍රීවරයන් කථානායකවරයාගේ සභාපතිත්වයෙන් යුතුව, කථානායකවරයා විසින් පත් කර ඇති බව දන්වනු කැමැත්තෙමි:—

ගරු කරු ජයසූරිය මහතා

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා

ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු (ආචාර්ය) විජේදාස රාජපක්ෂ මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු තලතා අතුකෝරල මහත්මිය

ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා

ගරු අබ්දුල් හලීම් මහතා

ගරු මනෝ ගනේසන් මහතා

ගරු ඒ. එච්. එම් ෆවුසි මහතා

ගරු වී. එස්. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු රුවන් විජයවර්ධන මහතා

ගරු සෙය්යිඩ් අලි සාහීර් මවුලානා මහතා

ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා"

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) නියෝජ්‍ය කථානායකවරයා විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව

(i) 2015 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ XII කොටස;

(ii) 2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XX, XXI, XXIII හා XXIV කොටස්, සිව්වැනි කාණ්ඩයේ V හා VII කොටස් සහ හයවැනි කාණ්ඩයේ XIII කොටස; සහ

(iii) 2017 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ I කොටස සහ දසවැනි කාණ්ඩයේ XIV හා XV කොටස්

පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි ද මුද්‍රණය කළ යුතු යැයිද නියෝග කරන ලදී.

(2) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2017 අංක 30 දරන විසර්ජන පනතේ 6 (1) වගන්තිය යටතේ 2018.07.01 සිට 2018.08.15 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන පිළිගන්වා, එම පරිපූරක වෙන්කිරීම පිළිබඳ සටහන රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂයේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින්

පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා පිළිගන්වා, එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3. **පාර්ලිමේන්තුවේ කටයුතු :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින ආණ්ඩුවේ කටයුතු මුඛ්‍යස්ථානය ගත යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

4. **අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 112හි විධිවිධානවල සහ 2018 ජූනි 20 හා 2018 ජූලි 17 දිනයන්හි පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවල කුමක් සඳහන්ව තිබුණද, ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව මන්ත්‍රීවරයන් එකොළොස් දෙනෙකුගෙන් (11) සමන්විත විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

5. **පාර්ලිමේන්තුවේ රැස්වීම් :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 8හි විධිවිධානවල සහ 2018.06.20 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 7.30 දක්වා විය යුතු ය. අ.භා. 5.30 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා.7.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

6. **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය :** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වැනි ව්‍යවස්ථාවට අනුව, ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව 2015.11.27 දින එච්. එම්. ගාමිණී විජේසිංහ මහතා විගණකාධිපති ලෙස පත් කර ඇත. ඔහුගේ වැටුප 153(2) ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර එය ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන හෙයින්ද;

උක්ත කරුණට අදාළව 2017.12.19 දින මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද යෝජනාව මෙයින් ඉවත් කර ගැනීමට කටයුතු කරන අතර ජනාධිපතිවරයා විසින් 2017.03.03 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළ 2017.03.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ 2017.11.14 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සටහනට අදාළ 2017.12.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විගණකාධිපති එච්. එම්. ගාමිණී විජේසිංහ මහතාට පහත පරිදි වැටුප් හා දීමනා ගෙවීමට අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) 2015.11.27 දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව SL – 4 වැටුප් පරිමාණයේ 08 වැනි වැටුප් පියවරේ පිහිටුවා වැටුප් ගෙවීම හා තනතුරට හිමි අනෙකුත් දීමනා ගෙවීමට;

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 අනුව 2016.01.01 දින සිට වැටුප පරිවර්තනය කිරීමේ දී SL – 4 වැටුප් ක්‍රමය යටතේ එම චක්‍රලේඛයේ උපදෙස් පරිදි වැටුප් පරිවර්තනය කර ගෙවීමට සහ එම වැටුප් පරිමාණයට අදාළ වාර්ෂික වැටුප් වර්ධක ගෙවීමට; සහ

(ඇ) එච්. එම්. ගාමිණී විජේසිංහ මහතාගේ අධ්‍යාපන සුදුසුකම්, අත්දැකීම්, සේවා පළපුරුද්ද මෙන්ම පූර්ව සේවාවේ වැටුප ද විශේෂ අවධානයට ලක් කර ඒ මහතාට 2017.03.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ඔහුට පමණක් පෞද්ගලික වන සේ, විගණකාධිපති තනතුරට අදාළ වැටුප් හා දීමනාවලට අමතරව මාසිකව රු. 50,000/- ක විශේෂ දීමනාවක් ලබා දීම.

ඒ අනුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(2) ව්‍යවස්ථාව අනුව, විගණකාධිපති එච්. එම්. ගාමිණී විජේසිංහ මහතා වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීම කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත :** දෙවැනි වර කියවීමේ නියෝගය කියවන ලදී.

''පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය''යි සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

(අ. භා. 1.30 ට නියෝජ්‍ය කාරක සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

''ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය යුතුය''යි ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.05 ට ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය.)

(අ. භා. 4.36 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය''යි සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය සභා සම්මත විය.

2 වැනි වගන්තිය

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක් : 1 වැනි පිටුවේ 10 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

''(ඇඇ) 39අ වගන්තියේ (1) වන, (3) වන සහ (4) වන'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු වාසුදේව නානායක්කාර මහතා විසින් යෝජනා කළ සංශෝධනයක් :

'' ඇඇඇ 39(අ) වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් විශේෂඥ දන්ත වෛද්‍යවරුන් විසින් තෝරා පත් කරගනු ලබන එක් සාමාජිකයෙක් යන තැනට පහත උප වගන්ති එකතු කළ යුතුය:-

' ඉඉ 56 වන වගන්තියේ සඳහන් ලියාපදිංචි ඖෂධවේදීන් විසින් තෝරා පත් කරගනු ලබන එක් උපාධිධාරී ඖෂධවේදී සාමාජිකයෙක්ද;

ඉඉඉ (60)ආ වගන්තියේ සඳහන් ලියාපදිංචි අතුරු වෛද්‍ය වෘත්තිකයන් අතරින් තෝරා පත් කරගනු ලබන එක් උපාධිධාරී අතුරු වෛද්‍ය වෘත්තිකයෙක්ද;

ඉඉඉඉ (60)(ඒ) වගන්තියේ සඳහන් ලියාපදිංචි පරිපූරක වෛද්‍ය වෘත්තිකයන් විසින් තෝරා පත් කරගනු ලබන උපාධිධාරී පරිපූරක වෛද්‍ය වෘත්තිකයෙක්ද;

ඊ සහ ඊඊ අමාත්‍යතුමා විසින් සාමාජිකයන් දෙදෙනෙකු නම් කරන අතර, එක් සාමාජිකයෙකු මාධ්‍යවේදියෙකු විය යුතු අතර, අනෙක් සාමාජිකයා මහ ජනතාව අතරින් තෝරා පත්කර ගත් අයෙකු විය යුතු ය.'''

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, නිශ්ප්‍රභ විය.

ගරු දයාසිරි ජයසේකර මහතා විසින් යෝජනා කළ සංශෝධනයක් :

2. (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 12 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

'' (ඇඇ) 39 වන වගන්තියේ (1) වන, (3) වන සහ (4) වන උපවගන්තිවල සඳහන් විශේෂඥ වෛද්‍යවරුන් විසින් තෝරා පත්කර ගනු ලබන සාමාජිකයන් තිදෙනෙක්ද;

(ඇඇඇ) 39අ වන වගන්තියේ (2) උප වගන්තියේ සඳහන් විශේෂඥ දන්ත වෛද්‍යවරුන් විසින් තෝරා පත්කර ගනු ලබන එක් සාමාජිකයෙක්;

ඉඉ 56 වන වගන්තියේ සඳහන් ලියාපදිංචි ඖෂධවේදීන් විසින් තෝරා පත් කරගනු ලබන එක් උපාධිධාරී ඖෂධවේදී සාමාජිකයෙක්;

ඉඉඉ (60) ආ වන වගන්තියේ සඳහන් ලියාපදිංචි අතුරු වෛද්‍ය වෘත්තිකයන් අතරින් තෝරා පත් කරගනු ලබන එක් උපාධිධාරී අතුරු වෛද්‍ය වෘත්තිකයෙකු;

ඉඉඉඉ (60) එ වන වගන්තියේ සඳහන් ලියාපදිංචි පරිපූරක වෛද්‍ය වෘත්තිකයන් විසින් තෝරා පත් කරගනු ලබන උපාධිධාරී පරිපූරක වෛද්‍ය වෘත්තිකයෙකු;

ඊ සහ ඊඊ අමාත්‍යතුමා විසින් සාමාජිකයන් දෙදෙනෙකු නම් කරන අතර, එක් සාමාජිකයෙකු මාධ්‍යවේදියෙකු විය යුතු අතර, අනෙක් සාමාජිකයා මහ ජනතාව අතරින් තෝරා පත්කර ගත් අයෙකු විය යුතු ය.''

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, නිශ්ප්‍රභ විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3 වැනි වගන්තිය සභා සම්මත විය.

4 වැනි වගන්තිය

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක් : 2 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 4 වැනි පේළිය දක්වා (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"ප්‍රධාන ප්‍රඥප්තියට 39අ,39ආ, 39ඇ සහ 39ඈ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, එම වගන්ති එම ප්‍රඥප්තියේ 39අ, 39ආ, 39ඇ සහ 39ඈ වගන්ති ලෙස බලාත්මක විය යුතුය :-";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කළ තවත් සංශෝධනයක් : 5 වැනි පිටුවේ 7 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"ලියාපදිංචි විශේෂඥ වෛද්‍යවරුන් හෝ විශේෂඥ දන්ත වෛද්‍යවරුන්ට අදාළ විශේෂඥයකු ලෙස වෘත්තියෙහි යෙදීමට හිමිකම ඇති බව.

39ඈ. 39ආ වන වගන්තිය යටතේ ලියාපදිංචි වූ විශේෂඥ වෛද්‍යවරුන්ට හෝ විශේෂඥ දන්ත වෛද්‍යවරුන්ට ශ්‍රී ලංකාව තුළ අදාළ විශේෂඥයකු ලෙස වෘත්තියේ යෙදීමටත්, ඒ වෘත්තියේ යෙදීමේ දී සපයනු ලබන ඖෂධ සහ ශල්‍ය උපාංගවල හෝ ලබාදෙන වෙනත් සේවාවල පිරිවැය ඇතුළත් වන සාධාරණ වෘත්තීමය ගාස්තුවක් ඉල්ලා සිටීමට සහ අයකර ගැනීමටත් හිමිකම තිබිය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු වාසුදේව නානායක්කාර මහතා විසින් යෝජනා කළ සංශෝධනයක් :

(1) "(අ) ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ යන ස්ථානයට පහත සඳහන් වාක්‍යය එකතු විය යුතුය:

' ප්‍රධාන ප්‍රඥප්තියේ VIII, VIII (අ), VIII (අඅ) යන කොටස්වලට අදාළ නොවන පරිදි' "

(2) "(ආ) නිශ්චිතව දක්වන සුදුසුකම් ඇති යන ස්ථානයට පහත සඳහන් වාක්‍යය එකතු විය යුතු ය:

' ප්‍රධාන ප්‍රඥප්තියේ VIII, VIII (අ), VIII (අඅ) යන කොටස්වලට අදාළ නොවන පරිදි' "

(3) " '39 අ. (1) වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති පරිදි....' යන ස්ථානයට පහත සඳහන් වාක්‍යය එකතු කළ යුතු ය:

' ප්‍රධාන ප්‍රඥප්තියේ VIII, VIII (අ), VIII (අඅ) යන කොටස්වලට අදාළ නොවන පරිදි' "

(4) " '39අ. (2) වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති පරිදි....' යන ස්ථානයට පහත සඳහන් වාක්‍යය එකතු කළ යුතු ය:

' ප්‍රධාන ප්‍රඥප්තියේ VIII, VIII (අ), VIII (අඅ) යන කොටස්වලට අදාළ නොවන පරිදි' "

(5) "39අ. (3) ස්ථානයටද එලෙසම, පහත කොටස එකතු කළ යුතු ය:

' ප්‍රධාන ප්‍රඥප්තියේ VIII, VIII (අ), VIII (අඅ) යන කොටස්වලට අදාළ නොවන පරිදි' "

(6) "39අ. (3)හි '... උපාධි ආයතනයේ යෝග්‍යතා මිනුම් දණ්ඩ සපුරාලන යම් තැනැත්තකුට....'යන ස්ථානයට පහත සඳහන් කොටස එකතු විය යුතු ය:

' ප්‍රධාන ප්‍රඥප්තියේ VIII, VIII (අ), VIII (අඅ) යන කොටස්වලට අදාළ නොවන පරිදි' "

(7) "39(ආ) උපවගන්තියේ (ඇ) හි'....ප්‍රතීතන සහතිකයක් ඉදිරිපත් කරන්නේ නම්...' යන ස්ථානයට පහත සඳහන් කොටස එකතු කළ යුතු ය:

' ප්‍රධාන ප්‍රඥප්තියේ VIII, VIII (අ), VIII (අඅ) යන කොටස්වලට අදාළ නොවන පරිදි' "

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිශ්ප්‍රභ විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

5 වැනි වගන්තිය

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක් : 5 වැනි පිටුවේ 24 වැනි පේළියේ සිට 28 වැනි පේළිය දක්වා (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

" වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය යන්නෙන්, 2014 ඔක්තෝබර් මස 11 වන දින සහ අංක 1883/ 17 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය මඟින් අවසන් වරට සංශෝධනය කරන ලද සහ කලින් කල සංශෝධනය කරනු ලැබිය හැකි පරිදි වන, 1991 මැයි මස 17 වන දින සහ අංක 662/11 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය අදහස් වේ;".

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

6 වැනි සහ 7 වැනි වගන්ති සභා සම්මත විය.

අලුත් වගන්තිය

ගරු වාසුදේව නානායක්කාර මහතා විසින් මතු සඳහන් අලුත් වගන්තිය යෝජනා කරන ලදී.

" වෛද්‍ය සභාවේ සියලුම සාමාජිකයන් - ඉ සහ ඊ යන කොටස් හැර ඉතිරි සියලුම සාමාජිකයන් - ප්‍රධාන ප්‍රඥාප්තියේ 20,41,56,60B සහ 60G යන වගන්ති යටතේ ලියාපදිංචි සාමාජිකයන් විය යුතුය."

වගන්තිය දෙවැනිවර කියවිය යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, නිශ්ප්‍රභ විය.

ප්‍රඥප්ති වගන්තිය හා නාමය

"ප්‍රඥප්ති වගන්තිය හා නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් තුන්වැනි වර කියවිය යුතුය"යි සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**8. ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග :** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 59 සහ 63 වගන්ති සමඟ කියවිය යුතු, 142(2) වගන්තියේ (ද) ඡේදය යටතේ 2017 අංක 2 දරන ඖෂධ ලියාපදිංචි කිරීම (ගාස්තු) නියෝග සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 05 දිනැති අංක 2052/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.04.03 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. කල් තැබීම (විදේශ කටයුතු අමාත්‍යාංශය රාජතාන්ත්‍රික සංචාර සංවිධානය කිරීමේදී මහජන මුදල් අවභාවිත කිරීම) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි, ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

"ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය යුතුය"යි විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 5.42 ට ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 6.22 ට, 2018 සැප්තැම්බර් 18 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.